

RD

# 11

# වාර්තා, නිර්මාණාත්මක හා කලාත්මක ඡායාරූපකරණය

ඡායාරූපකරණයේදී භාවිත කරන කැමරා, කැමරා කාච හා අනෙකුත් උපකරණ පිළිබඳ අධ්‍යයනයෙන් හා පුහුණුවෙන් පසු ඕනෑම සාමාන්‍ය දැකීමක් ඇති අයෙකුට ඡායාරූප ශිල්පියෙකු ලෙස කටයුතු කළ හැකිය. ඡායාරූප ශිල්පියෙකු ලෙස උසස් තලයකට එළඹීී පහසු වන්නේ යම් නිශ්චිත පරමාර්ථයක් ඔස්සේ කටයුතු කිරිමෙනි. එම පරමාර්ථය සාර්ථකව ඉෂ්ඨ කර ගැන්මේ ප්‍රතිශතය අනුව ඡායාරූප ශිල්පියාගේ හැකියාව පිළිබිඹු වේ.

මේ සඳහා පළමුවෙන් ඔහු ගන්නේ කුමන වර්ගයේ ඡායාරූපදැයි තෝරා බේරා ගත යුතුය. ඡායාරූප ශිල්පය වඩාත් ප්‍රකටව ඇත්තේ වාර්තා මාධ්‍යයක් ලෙසිනි. බොහෝ දෙනා එහි ඇති නිර්මාණාත්මක ලක්ෂණ හඳුනාගත්තද කලාත්මක ලක්‍ෂණ හඳුනන්නේ නැත. එබැවින් ප්‍රථමයෙන් ප්‍රධාන ඡායාරූප දහරාවන් හඳුනා ගැනීම හා ඒවා වෙනම අධ්‍යයනය කිරීම වැදගත් වෙයි. යම් එක වර්ගයක් තෝරා අධ්‍යයනය කිරීමෙන් ඒ පිළිබඳ විශේෂ වූ දැනුමක් හා අත්දැකීමක් ලබාගත හැකිය. පසුව තමන් තෝරා ගන්නා දහරාව අනුව තමන් භාවිත කරන උපකරණ පවා වෙනස් කරන්නට සිදුවීමට ඉඩ ඇති බව පසක් වනු ඇත. තමන් කැමති නම් ඡායාරූප ශිල්පියෙකුට මෙම